# මා සොයා ආ පුංචි සිත්



ටී.පී.ජී.එස්. අල්විස්

# මා සොයා ආ පුංචි සිත්





## ටී.පී.පී.එස්. අල්විස්




| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | : | 2023 |
| පොතේ නම | : | මා සොයා ආ පුංචි සිත් |
| කර්තෘ | : | ටී.පී.ජී. සුසිතා අල්විස් මිය<br>සහකාර විදුහල්පතිනිය<br>මහාමායා බාලිකා විදුහල<br>ප්‍රාථමික අංශය<br>මහනුවර |
| **ISBN** අංකය | : | 978-624-208-147-2 |

මුද්‍රණය

**“PRESS”**

නොඃ 24, කොටුගොඩැල්ල වීදිය,

මහනුවර.

# පිදුම

*මගේ ගුරු දිවිය,*

*විදුහල්පති දිවිය රසවත් කළ*

*සියලු දුවා දරුවන්ට...*

*සියලු තැන්හි දී හමුවූ*

*දරුවන්ට සෙනෙහස දෙන*

*සංවේදී හිත්වලට...*

*මගේ ආදරණීය සැමියාට...*

*දුවට...*

*පුතුන් දෙදෙනාට...*

*ආදරයෙන් පුදමි*

* * *

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-11-01

# ස්තූතිය

දිවිය දිනන විද්‍යුත් පොතක් වෙනුවෙන්
කිසියම් සටහනක් ලිවීමට අදහස් ඇති කළ
මහාමායා ප්‍රාථමිකයේ කුඩා දැරිවියන්ට...
එහි ආදරණීය ආචාර්ය මණ්ඩලයේ සැමට...

ලියන්නට ම ලියන්නට ම යැයි කියමින්...
පසු පස ම පැමිණ...
විදුහල්පති දිවියේ මේ දරුවන් හා බැඳුණු
රස මතක ලියනා තෙක් ම...
පෙරැත්ත කර
මා ලියූ අකුරු පොතක් ලෙස සකසා ගෙනැවිත් දුන්
මහාමායාවේ
සමන්මලී ගුරු දියණියට ...
චිත්‍රපත් ඇඳ දුන්
4C පන්තියේ සතිනි දුවටත්...
ස්තූතිවන්ත විය යුතුමයි.

2023-12-14
මහාමායාවේ දී

# පියුමි

පියුමි විදුහල්පති කාර්යාලය අසල හොරගල් අහුලමින් ඉන්න බව විදුහල්පතිතුමිය ජනේලයෙන් ඉවත බලාගෙන ඉන්න විට දුටුවා.

එසැනින් ම කවීෂා සහ නදීමා දුවගෙන විදුහල්පති කාර්යාලයට ආවා.

මොකක් හරි අවනඩුවක් කියන්න වෙන්න ඇති, විදුහල්පතිතුමිය හිතුවා.

''මැඩම්.. පියුමි මගෙ තාත්තගෙ ඇඟේ කබර වගේ කියනවා. කැතයි කියනවා. මට විහිළු කරනවා.'' කියා ඇස් දෙක අතින් වසාගෙන කියන්නට විය.

''අනේ මැඩම්.. පියුමි මගෙ තාත්තාටත් එක එක ඒවා කියනවා. මගේ තාත්තා ඇවිදිනකොට කොර ගහනවා කියලා හිනාවෙනවා.'' කියලා නදීමාත් නොනවත්වා කියන්නට විය.



දෙදෙනා ම පන්තියට යන්න කියා විදුහල්පතිතුමිය කල්පනා කරන්නට විය. මේ වෙනුවෙන් කළ යුත්තේ කුමක් ද ?

විදුහල්පතිතුමිය පියුමි චූටි දුවව විදුහල්පති කාමරයට කැඳවූවා. ඇය ඉතාමත් කීකරු දරුවකු සේ බයෙන් බයෙන් කාර්යාලයට ආවා.
''මොකද පියුමි, මේ කවීශාගෙයි, නදීමාගෙයි තාත්තලාගෙ අඩුපාඩු කිය කියා විහිළු කරන්නෙ. එක එක කතා කියලා. ඔයා කැමති ද ඔයාගෙ තාත්තට කවුරුත් එහෙම විහිළු කරනවාට.''

පියුමිගේ ඇස් දෙකෙන් කඳුළු ගංගාවක් ගලා හැලෙන්නට විය.

''පියුමි.. අඬන්නෙ නැතිව මොකද වුණේ කියන්නකෝ.''

පියුමි ගොත ගසමින් කියූ දේ විදුහල්පතිතුමියට අකුණු පහරක් ගැසුවා සේ විය.



''මැඩම්.. මට තාත්තෙක් නෑ. එයා මැරිලා.''

විදුහල්පතිතුමියගේ සිත වෙඬරු පිඩක් සේ උණු වී වැගිරෙන්නට විය. විදුහල්පතිතුමිය පියුමී ව තුරුළට ගෙන, ''පුතේ, මගෙත් තාත්තා නෑ. එයා අපිව දාලා ගිහිල්ලත් ගොඩක් කල්. බලාගෙන යද්දි අපි දෙන්නා ම එක වගේ දුකින්. අද ඉඳන් ඔයා මගේ යාළුවෙක්.'' විදුහල්පතිතුමිය පියුමිගේ හිස අතගාමින් කීවා. පියුමි හෙමිහිට විදුහල්පතිතුමියට තුරුළු වුණා. මැඩම්, මැඩම්ට මට අම්මා වෙන්න පුළුවන් ද?



''මැඩම් මගෙ අම්මත් ගෙදර නෑ. එයා රට ගිහින්.''

''ඔව් පුතේ අද ඉඳන් මමයි ඔයාගෙ අම්මා, හොඳ ම යාළුවා. ඔයාට කැමති දෙයක් මගෙන් ඉල්ලන්න. මට කියන්න.''

පියුමි ඇස් ඔසවා කඳුළු පිරි දෙනෙතින්.. නමුත් ආදරෙන් විදුහල්පතිතුමිය දෙස බැලුවා. දුවගෙන පන්තියට ගියා.

විදුහල්පතිතුමිය නදීමා සහ කවීෂාටත් කර්යාලයට එන්නට කියා අවවාද කළා. දෙමව්පියන් නැති දරුවන්ට දැනෙන හැඟීම් ගැන කිව්වා. පියුමිට ආදරෙන් සලකන්න යැයි කිව්වා. ඇය ඉදිරිපිට තමන්ගේ තාත්තලා ගැන කියන්නට එපා යැයි අවවාද කළා. තුන්දෙනා ම යාළුවන් වී සිටින්නට යැයි කියුවා.

පියුමි පිළිබඳ ව නිතර පන්තිභාර ගුරුතුමිය හරහා පියුමිට නොදැනෙන්නට සොයා බැලුවා.



මේ වන් දී පියුමි වැඩුණු දැරියක් ව ශිෂ්‍යත්වය සමත් ව ඉහළ පාසලට ගොසින්.

විදුහල්පතිතුමියගේ සිතේ නොමැකෙන මතකයන් ඉතිරි කරමින්...

''දයාබර දරුවනේ, සැමදා ම යහළුකමින් සිටින්න. එකිනෙකාගේ අඩුපාඩු අපහසුතා දැක අවමන් කරන්නට එපා. හැමෝට ම ආදරෙන් සලකන්න. පියුමි වැනි සිය ගණන් යෙහෙළියන්ගේ ඇස්වල සතුට දකින්නට බලා සිටින්න. ඔබට දිය හැකි පණිවිඩය එයයි.''

# සවින්දි

සවින්දි තමාගේ අලුත් පාසලේ තුන ශ්‍රේණිය පන්තියට එන්නේ කුතුහලය පිරි දෑස් අයාගෙනයි.

සතියක් පමණ පාසලට පැමිණියත් ඇයට කිසිදු යෙහෙළියක් සිටියේ නැත. ඇය පන්තියේ සිටියේ හුදෙකලාවයි. පන්ති භාර ගුරුතුමියට ද ඇගේ මේ හැසිරීම නිරීක්ෂණය විය.

තවත් දින කිහිපයක ඇවෑමෙන් එළඹී සඳුදාවේ ඈ පාසල් යාමට අදිමදි කරන්නට විය. බඩ රිදෙන බවක් කියමින් හඬන්නට විය. දරුවාගේ හැඬීම ගණනකට නොගත් ඇගේ කාර්යබහුල දෙමවුපියන් පෙරත්තය ඉවසමින් අකමැත්තෙන් හෝ පාසල වෙත පැමිණි ඈ පාසලේ ගේට්ටුවේ එල්ලී හඬමින්, කඳුලු වගුරමින් අම්මාගේ සාරියෙන් අදිමින් කෑගසන්නට විය.



කොතෙක් උත්සාහ ගත්ත ද ඇගේ හැඬුම නවතාලන්නට කිසිවෙකුට ත් නොහැකි විය.

දිනක් පන්ති භාර ගුරුතුමිය සමඟ ඇය ඇගේ මවත් සමඟ විදුහල්පතිතුමිය හමුවීමට පැමිණියා. පන්ති භාර ගුරුතුමියත් සවින්දිගේ මේ හැසිරීම ගැන සිතා ඇයට අවධානය හා අවශ්‍ය ආදරය ලබාදෙමින් සිටියා. සවින්දි තරමක් සතුටින් ඉන්නා බව පෙණුනා.

විදුහල්පතිතුමිය විස්තරය හොඳින් අසා සිටියා. ඈ සවින්දිගේ හිස ආදරයෙන් අතගෑවා.

''පුතේ, ඔයාට පේනවා නේද ඔෆිස් එක ඇතුළෙ වැඩ ඉන්න බුදු සාදු. බුදු සාදු බලාගෙන ඉන්නෙ ඔයා වගේ ලස්සන ළමයි බුදු පිළිමයට මල් වට්ටියක් අරගෙන එනවා ද කියලා.''

''පුතේ, හෙට ඉඳන් ඔෆිස් එකේ බුදු සාදුට මල් වට්ටියක් අරගෙන උදෙන් ම එන්න පුළුවන් ද?'' කියලා ඇහුවා.

සවින්දි අහිංසක වී බිම බැලුවා. ඇස් අගිස්සෙන් උස්සලා, හෙමිහිට, ''හා මැඩම්'' කිව්වා.

පුදුමයක්. එදා ඉඳන් හැමදාම උදේට ලස්සන මල් වට්ටියක් අරන් සවින්දි විදුහල්පතිතුමිය ඉදිරිපිට.. ඒ හැමදාම විදුහල්පතිතුමිය, ''මගෙ හොඳ දුව.'' කියලා ඇගේ ඔලුව අතගෑවා.



හැමදාම කට කොනින් හිනාවෙලා පන්තියට දුවගෙන යන සවින්දි දකින විට විදුහල්පතිතුමියගේ මූණෙ ඇඳුණෙ හරි අපූරු හිනාවක්.

''ඔව් දරුවනේ.. බුදු සාදු හැමදාම හොඳ වැඩ කරන හොඳ දරුවො දිහා බලාගෙන ඉන්නවා ආදරෙන්. මගෙ දුවත් හොඳ දරුවෙක් වෙනවා නේද?''

# මිනාරා

මිනාරා පියා සමඟ ගේට්ටුව අසලට ඇවිත් පියාට අත වනමින් සතුටින් පාසල වෙත පියනගයි. නමුත් මිනාරා ටික වේලාවකින් සෑම දින ම ''අම්මා... මට අම්මා බලන්න ඕන'' කිය කියා පන්තිය ඉදිරියේ ලොකු කලබලයක් කරයි.

පන්ති භාර මැඩම් මිනාරා දියණිය සැනසීමට කොතරම් උත්සාහ කළත් එය සාර්ථක නොවන අවස්ථාවල කාර්යාලයට ද ඇය කැඳවාගෙන එයි.

''නෑ මට ගෙදර යන්න ඕන'' කියා අඬයි.

පසුවදා ද හොඳින් පියාගේ අතේ එල්ලී ඇවිත් ටික වේලාවක් යන විට පෙර පරිදි ම අඬයි.

විදුහල්පතිතුමිය දිනක් දරුවා පන්තියට නොයවා කාර්යාලයේ රඳවා ගෙන කතන්දර පොතක් කියවන්නට දී බලා සිටියා. ටික වෙලාවකට පසු මිනාරා පොත කියවීම පසෙකලා කල්පනා කරන ආකාරය ඇය දුටුවා.

එක්වරම දැරිය...
''මගේ අම්මා මැරෙයි.. මගෙ අම්මා මැරෙයි..'' කියලා කෑ ගසන ආකාරය දුටු විදුහල්පතිතුමිය මහත් සේ කලබල වී එතැනට ගියා.

දැරිය දහඩිය දමමින් වෙව්ලන්නට ගත්තා. විදුහල්පතිතුමිය හිස අත ගා කාර්යාලයේ තිබූ චොක්ලට් එකක් දෙමින් මිනාරාව තුරුළු කර ගත්තා.

මිනාරා කටහඬ අවදි කළා.
''මැඩම්, අපේ අම්මයි, තාත්තයි හැමදාම රණ්ඩු වෙනවා. මට ඉස්කෝලෙ දෙන ගෙදර වැඩ කරගන්නත් බැරිවෙනවා. හැමදාම මටත් බනිනවා. මට බයයි. අම්මා මාව දාලා යයි කියලා.'' මිනාරා නොනවත්වා කියන්න ගත්තා.

විදුහල්පතිතුමිය මිනාරා ව තුරුළු කරගත්තා. හිස අත ගා ආදරෙන්, ''මම අම්මටයි තාත්තටයි කතා කරන්නම් කෝ. එයාලට රණ්ඩු නොවී ඉන්න කියමු.''

මිනාරාගේ ඇස්වල යන්තම් සතුටක් පෙනුණා.

පෙර දින කළ දැනුම් දීමකට අනුව පසුදා උදෑසන ඇගේ මව හා පියා කාර්යාලය ඉදිරිපිට බලා සිටියා. විදුහල්පතිතුමිය ඔවුන් ව ඇතුළට කැඳෙව්වා.

''අනේ මැඩම්, මගෙ **Wife** ට මන් ගැන සැකයි. ගෙදර ආපු වෙලාවෙ ඉඳලා කෝල් කරන්නෙ කවුද කිය කියා අහනවා. හැමතිස්සෙ ම රණ්ඩු. මේ දරුවා නැත්නම් මම මෙයාව දාලා ගිහින්.'' දියණියගේ පියා දිගු විස්තරයක් කීවා.

මිනාරගේ අම්මාත් කඳුළු පිරුණු දෙනෙතින් බලා සිටියා.


''මිනාරගෙ අම්මේ, තාත්තේ, පවුලක් අතර සමගිය වැඩිපුර ම දැනෙන්නෙ දරුවන්ට. දැන් ඔය රණ්ඩු නවත්තන්න. තියෙන ප්‍රශ්නයක් දරුවා නැති වෙලාවට දෙන්නා කතා කරල විසඳගන්න. දරුවා හරි ම දුකින්. මේ දරුවා ඔයාලා දෙන්නගෙ ම. දරුවා හදාගන්න දෙන්න ම කැපකිරීම් කරන්ට ඕනෙ.'' කියමින් කරුණාවෙන් උපදෙස් දුන්නා.

දෙමවුපියන් කඳුළු සලමින් විදුහල්පතිතුමියට වැඳ පිටත් වුණා.

මාසයක් පමණ ගත වුණා. මිනාරා පියාගේ අතේ එල්ලෙමින් පැමිණ ගේට්ටුව ළඟින් ඇතුළට ආවේ.. සිනහමුසු මුහුණිනුයි.

දුවගෙන විත් විදුහල්පතිතුමිය වෙත පැමිණ මල් පොකුරක් දී වැන්දා.

''මැඩම්.. අද මගේ උපන් දිනේ. මම ගොඩාක් සතුටින්. මගේ අම්මයි තාත්තයි මට ගොඩක් ආදරෙයි දැන්. එයාලා අපට ඉන්න ගේකුත් හදනවා. අම්මා කීවා මැඩම් තමයි අපට සතුට දුන්නෙ කියලා. මැඩම්ට මල් දීලා ස්තුතියි කියන්න කියලා.''



පන්තිභාර ගුරුතුමිය කැඳවා මේ ගැන සාකච්ඡා කරන විට.. දරුවා දැන් ප්‍රීතියෙන් වැඩ කරනා බව දැනගත්තා.

විදුහල්පතිතුමියගේ මූණේ ඇඳුණු සතුටු හිනාව දකින්න ඔබත් එතැන ඉන්නටයි තිබුණේ. එය කලාතුරකින් කෙනෙකුගේ මුහුණේ ඇඳෙන හිනාවක්. සතුට යනු එයයි. කාගේ හෝ සිතකට සතුටක් ගෙන දී සතුටු වීම. එය හරි ම උසස්. ඔබත් එසේ වන්න.

# මල් පොහොට්ටුව

හැමදාම පාසල් මිදුලේ ලස්සනට පිපෙන රෝස මල් ගස් ටිකේ දළු ඉතා විනාශකාරි ලෙස කඩා දමා ඇති බව විදුහල්පතිතුමිය දකියි. ඇය කම්පනයට පත් වේ.

උදේ රැස්වීමේ දී විදුහල්පතිතුමිය නිතර ම ගහකොළ ආරක්ෂා කිරීමේ වැදගත්කම කොතෙක් කියා සිටියත් මේ මල් කඩා දැමීම අඩුවූයේ නැහැ.

දිනක් උදෙන් ම පාසලට එන දරුවන් දෙදෙනෙකු කැඳවා විදුහල්පතිතුමිය පොඩි රාජකාරියක් පැවරුවා.

''සෙල්ලම් කරන ගමන් පොඩි අවධානයකින් ඉන්න මල් ගස්වල දළු කඩන්නෙ කවුදැයි කියා.''

එක් බදාදා දිනයක උදෑසන හතට පමණ විදුහල්පතිතුමිය දුටුවා කාර්යාලය අසල කණුවකට මුවා වී එක් කුඩා සිසුවියක ඉකිබිඳිනා බව. ඒ අසල අර ඉහත කී වැඩ පැවරූ දියණියන් දෙදෙනා ද සිටිනු දුටුවා.

මඳ වේලාවකින් එම දරුවන් දෙදෙනා අඬන ළමයාව අතින් අල්ලාගෙන විදුහල්පතිතුමිය වෙත රැගෙන ආවා. විදුහල්පතිතුමිය එම දරුවන් දෙදෙනා පිටත් කොට යවා දරුවාගෙන් කරුණු විමසුවා.

මල් කැඩුවේ ඇය බව ඈ හඬමින් කිව්වා.

''ඇයි පුතේ ඔයාලගේ ගෙදර මල් වවලා නැද්ද?'' විදුහල්පතිතුමිය විමසුවා.
''මැඩම්, අපේ අම්මා මල් වවන්නෙ නෑ. අපියි බාප්පලයි එක ගෙදරක දෙපැත්තෙ ඉන්නේ. තියෙන්නෙ එක මල් වත්ත යි. ඒ පුංචිගෙ මල් වත්ත. පුංචිගෙ මල් පැළවීගෙන එනකොට අපේ අම්මා ඊට හොරෙන් ඒ මල් මොට්ටු කඩලා දානවා.

අපේ අම්මා හදිසියේ මල් වැව්වොත් ටික දවසකින් ඒවා කඩා දානවා. කවුද දන්නෙ නෑ.''

වෛරය, ක්‍රෝධය දෙමව්පියන් හරහා ළමයින්ට අත්විඳින්න ට සිදුවෙනවා. විදුහල්පතිතුමිය ට කාරණය වැටහුණා.

ඊළඟ දිනයේ එතුමිය දරුවා රෝස යාය වෙත කැඳවා ගෙන ගියා. මල් පිපෙන්නට පෙර අවස්ථාවේ, පොහොට්ටු කැඩීම හොඳ නැති බව කියමින් අවවාද කළා.

''ගහකොළ, සතා සීපාවාට අපි ආදරය කරන්න ඕන. මේ මල් හරි ලස්සනයි. පිපලා තියෙද්දි අතගාන්න පුළුවන්. ඒත් නිකරුණේ පිපෙන්න තියෙන මල් මොට්ටු කඩා දමන්න එපා.'' ආදරෙන් කියුවා.

එදා සිට පාසල තුළ මල් පැළ, අතු රිකිලි කඩා දැමීම නැවතුණා. විදුහල්පතිතුමිය ට මහත් සැනසීමක් දැනුණා.

අම්මාව ගෙන්වා අවවාද කළා.

''එදා ඉඳන් අපෙ ගෙදර ත් මල් කඩන්න කවුරුත් ආවෙ නෑ මැඩම්'' දැරිය සතුටින් කිව්වා.

දැරිය බොහෝ උදයන්හි පැමිණ රෝස මල් යායේ අසිරිය විඳිමින් ඉන්නට පුරුදු වුණා.

විදුහල්පතිතුමිය සතුටට පත් වුණා. ඇය විසින් දරුවා නිවැරදි කිරීමට ගත් උත්සාහය ගැන ඇගේ සතුටට හේතු වුණා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුර අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023-11-01